**පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණ ව්‍යාපෘතිය - 2017**

-----------------------------------------------------------------------

පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5792 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි 2(අ)(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ/ මෙහෙයවීමේ නියෝජිතායතනය වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ සංරක්ෂණය හා ප්‍රජාවන්ගේ අභිවෘද්ධිය උදෙසා ශ්‍රී ලංකාවේ සංවේදී පරිසර පද්ධතිවල කළමනාකරණය ඉහළ නැංවීමයි. ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,504.75 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 45 ක් වන අතර මුළු ණය ප්‍රමාණයම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 ජුනි 30 දින නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය හා ප්‍රදාන යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව සහ

(ඌ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැය ගත ප්‍රතිපාදන හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | කාලපරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන් කිරීම | | 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩොලර් මිලියන | රු.මිලියන | එ.ජ.ඩොලර් මිලියන | රු.මිලියන | එ.ජ.ඩොලර් මිලියන | රු.මිලියන |
| ජා.සං.ස | 45 | 6504.75 | - | - | 1.32 | 199.38 |
| ශ්‍රී ලංකා රජය | - | - | - | * | - | 3.69 |
| මුළු එකතුව | 45 | 6504.75 | - | - | - | 203.07 |

* මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ 2017 අයවැය ඇස්තමේන්තුව මඟින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාමට රු.මිලියන 3.8 ක ප්‍රතිපාදනයක් රේඛීය අමාත්‍යාංශයේ අනෙකුත් වැඩසටහන් වලට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් මාරු කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

ලද තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් සමස්ථ ව්‍යාපෘති කාලසීමාව සඳහා සවිස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද, ව්‍යාපෘති ඇගයීමේ වාර්තාව අනුව, ව්‍යාපෘතියේ කටයුතු 2016 ජූලි 26 දින සිට ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණි.

**3.3 ව්‍යතිරේක වියදම්**

2017 ඔක්තෝබර් 23 සිට 27 දක්වා කොළඹදී පවත්වන ලද ව්‍යාපෘතියේ අරමුණුවලට සෘජුවම අදාල නොවන කාර්යයක් වූ ආසියා ශාන්තිකර වනාන්තර සමුළුව පැවැත්වීම සඳහා රු.මිලියන 5.55 ක මුදලක් වැය කර තිබුණි.

## 3.4 මූල්‍ය පාලනය සම්බන්ධ ගැටළු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම 2018 ජනවාරි 01 දින සිට පිළියෙල කර තිබු බව නිරීක්ෂණය වූ අතර එම නිසා සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් ඒ තුළ ඇතුළත්ව නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) තොග ලේඛන පොත යාවත්කාලීන කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

(ඇ) 2016 ජුනි 10 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.